**ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**
**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
--------------

**1.1 තත්ත්වාගණනය කල විගණන මතය**
------------------------------------

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**
**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

> ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

-------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

-------------------------

| | | | |
|---|---|---|---|
| (I) | 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් අනුව වාහනවල අගය රු.148,470,000 ක් ලෙස දක්වා තිබුණද වාහන ලේඛනය අනුව වාහන 07 කට අදාලව අගය රු.2,845,000 කින් වැඩියෙන්ද එක් වාහනයක අගය රු.300,000 කින් අඩුවෙන්ද දක්වා තිබුණි. | ජංගම නොවන වත්කම් ප්‍රකාශය හා වාහන ලේඛනයේ අගයන් සමාන විය යුතුය. | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රකාශවලට ගෙන ඇත්තේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේතුවේ උපදෙස් මත අදාල වර්ෂයේ 2018.04.14 රක්ෂණ ආයතන විසින් ලබාදී ඇති තක්සේරු අගයන් වන අතර එය ස්ථාවර වත්කම් වාර්තාවේ සඳහන් කර ඇත. |
| (II) | ලීබඩු , කාර්යාල උපකරණ සහ යන්ත්‍ර අත්පත් කර ගැනීම රු.10,559,475 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම් අත්පත් කර ගැනීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. | උපකාර්යාල මිලදී ගත් වත්කම් 2018.12.31 දිනට ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවට ඇතුලත් වී නොතිබීම මෙම වෙනසට හේතු වේ. |
| (III) | දේපළ පිරියත හා උපකරණ අගය 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු.694,092,706 ක් ලෙස දක්වා තිබූ අතර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට අනුව රු.748,119,858 ක් වූයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් රු.54,027,152 කින් අඩුවෙන් දක්වා තිබුණි. | දේපළ පිරියත හා උපකරණ අගය නිවැරදිව ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අඩුවෙන් දැක්වීමේ වරද නිවැරදි කරන බව මෙයින් දන්වමි. |

**1.6.2 ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට ආදායම් ශීර්ෂයක් නොමැති අතර ආදායම් නොවන ලැබීම් රු.298,614,039 ක් ආදායම් ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි ආදායම් ශීර්ෂයන් යටතේ ගිණුම් ගත කළ යුතුය. | ආයතනයේ පහසුව සඳහා 2018 වර්ෂය තුළ වෙනත් ආයතන වෙනුවෙන් එකතුකළ ආදායම ඇතුළත් කර ඇත. |

**1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.297,461 ක ණය ශේෂ වසර 02 කට ආසන්න කාලයක සිට අය නොවී පැවතුණි. | නිලධාරින් විශ්‍රාම ගැනීමට පෙර ලබාගත් ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | එක් අයකුගේ ණය ශේෂ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට තීරණය කර ඇති අතර අනෙක් අයගේ ණය ශේෂය ද විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි ඉඩම් පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි ඉඩම් පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතුය. | පවතින තොරතුරු මත ඉඩම් සම්බන්ධ වත්කම් වාර්තා නඩත්තු කර ඇත. |

**(ආ) බැරකම් පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කල හැකි වන පරිදි බැරකම් ලේඛනයක සටහන් කළ යුතුය. | වාර්තාවක් ලෙස යාවත්කාලීන කර ඇත. |

**1.6.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | මෙම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලන සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතිය දැනට ක්‍රියාත්මක වන අතර අදාළ අභ්‍යන්තර ක්‍රමවේද ඉදිරියේදී වාර්තාවක් ලෙස ඉදිරිපත් කරන බව දන්වමි. |

### 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | **2018 ජනවාරි 24 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | | | | |
| | 1 පරිච්ඡේදය | | | | |
| (I) | | - | සේවයේ නියුක්ත සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදු කළ යුතු වුවත් එවැනි කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කළ යුතුය. | සේවයේ නියුක්ත සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමක් මෙම දෙපාර්තමේන්තුවේ සිදු නොකළ අතර ඉදිරි වර්ෂයේදී ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරමි |
| (II) | 6.1 පරිච්ඡේදය | - | දෙපාර්තමේන්තුව 2016 – 2020 කාලපරිච්ඡේදය සඳහා පුහුණු සැලැස්මක් පිළියෙල කර තිබුණත් චක්‍රලේඛ විධිවිධාන පරිදි කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සැලසෙන පරිදි පුහුණු වැඩසටහන් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කළ යුතුය. | 2018 වර්ෂයේ මුළු ප්‍රතිපාදනය දෙපාර්තමේන්තුවේ දැනට සේවය කරනු ලබන නිලධාරින් සංඛ්‍යාවට පුහුණුව ලබා දීමට ප්‍රමාණවත් නොවේ. අත්‍යාවශ්‍යතා මත පුහුණුව ලබා දෙන අතර ඉදිරියේදී සියලුම නිලධාරීන්ට පුහුණුව ලබා දීමට කටයුතු කරනු ලැබේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය **2006 භාණ්ඩ සහ වැඩ** ------------------------ 8.9.1 ඡේදය හා 8.9.3 ඡේදය | 717,000 | කන්ටේනර් බහාලුම මිලදී ගැනීමේ දී විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් ලබා දී නොතිබූ අතර කොන්ත්‍රාත් ගිවිසුමකටද එළඹී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දැනට දෙපාර්තමේන්තුව මඟින් කොන්ත්‍රාත් ගිවිසුම් සකස් කරනු ලබන්නේ සම්මත ලංසු කැඳවීම් ලේඛන භාවිතා කර මිලදී ගැනීම් සිදුකරනු ලබන අවස්ථාවන් සඳහා පමණි. එබැවින් මෙම මිලදී ගැනීම් සඳහා ප්‍රතිග්‍රහන ලිපියක් (Letter of Acceptance) පමණක් නිකුත් කරන ලදි. |

**1.6.7 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂයන් හා 2018 ජනවාරි 01 දිනට වූ ශේෂයන් සමග සැසඳීමේ දී වත්කම් අයිතම 03 කට අදාලව රු.550,985,491 ක් වැඩියෙන් හා අයිතම 02 කට අදාලව රු.69,603,146 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ ආරම්භක ශේෂයන් පෙර වර්ෂයේ අවසාන ශේෂවලට සමාන විය යුතුය. | ආරම්භක හා අවසාන ශේෂ නිවැරදි බවට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තාවක් ලබා දී ඇති අතර එහි වටිනාකම 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වලට ඇතුළත් කර ඇති බවත් එම ශේෂ නිවැරදි බවත් මෙයින් දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 14 ක ඇස්තමේන්තුවල සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර | වාර්ෂික ඇස්තමේන්තු සැකසීමේ දී විචලනයන් අවම වන ආකාරයෙන් | 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපාදන වලට වඩා අඩු ප්‍රමාණ ලැබීම හා අමතර ප්‍රතිපාදන |

| | | | |
|---|---|---|---|
| | විචලනය රු.16,000 සිට රු.20,004,000 කින් හෙවත් සියයට 10.67 සිට සියයට 92.50 ක් දක්වා වී තිබුණි. | පිළියෙල කිරීමට වගබලා ගත යුතුය. | ඉල්ලුම් කලත් තිබෙන ප්‍රතිපාදන නොලැබීම හා අත්‍යවශ්‍ය වියදම් අනිවාර්යයෙන්ම දැරීමට සිදුවීම විචලනයන්ට හේතු විය. |
| (ආ) | ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ වූ සමස්ත ඉතිරිවීම් වැඩසටහන් 01 ට හා 02 ට අදාලව පිළිවෙලින් රු.4,467,498 ක් හා රු.11,538,482 ක්වූ අතර එම ඉතිරිවීම් වැඩසටහන්වලට අදාල ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 48.5 ක් හා සියයට 6.6 ක්ද විය. | සැලැසුම් කළ කාර්යයන් වර්ෂය තුළ නිම කිරීමට කටයුතු කළ යුතුය. | ලී බඩු උපකරණ හා යන්ත්‍ර පමණක් මිළදී ගත් අතර පරිගණක යන්ත්‍ර මිළදී ගැනීමට ලංසු කැදවූ අවස්ථාවේ මිල ඉහල යාම හේතුවෙන් මිළ ගණන් ඉදිරිපත් නොවුණි. තවද පරිගණක යන්ත්‍ර නඩත්තු වියදම්ද නොවුනි. වාහන අළුත්වැඩියා කිරීම ඇස්තමේන්තු අනුමත කිරීම ප්‍රමාදවීම මුදල් ඉතිරි වීමට හේතු විය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉදිරිපත් කරන ලද බැරකම් වාර්තාව අනුව රු.2,010,677 ක බැරකම් දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල බැරකම් කිසිවක් දක්වා නොතිබුණි. | බැරකම් ලේඛනය නිසි පරිදි වර්ෂයේ නිවැරදි කර බැරකම් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | ඉදිරි වර්ෂවල සිගාස් වැඩසටහන තුළ හා මූල්‍ය ප්‍රකාශ තුළ බැරකම් වාර්තා කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ආ) | වැය විෂයන් 10 ක ප්‍රතිපාදන ඉක්මවා රු.1,543,275 ක බැරකම්වලට එළඹ තිබුණි. | බැරකම්වලට එළඹීමේ දී වර්ෂයේ ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවීමට වගබලා ගත යුතුය. | පිළිතුරු එවා නැත. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ගැනීම සඳහා විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් 2018 වර්ෂයේ දී රු.2,214,967,537 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් වර්ෂය තුළදී රු.1,575,232,882 ක ගෙවීම් කර තිබුණු අතර වර්ෂය අවසානයේදී රු.639,734,655 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය සමස්ත ප්‍රතිපාදනයෙන් 29% ක් විය. | දෙපාර්තමේන්තු විසින් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමටත් කටයුතු කළ යුතුය. | වෙනත් දෙපාර්තමේන්තු වැය ශීර්ෂ සම්බන්ධව ඉතිරිවීම් සම්බන්ධ වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන Turnkey ව්‍යාපෘති අතුරින් රුපියල් මිලියන 57.86 ක පිරිවැයට ඇස්තමේන්තු කර තිබූ ව්‍යාපෘති 12 ක කිසිදු කාර්ය සාධනයක් අත්පත් කරගෙන නොතිබුණු අතර ඊට අමතරව රුපියල් මිලියන 217.67 ක Turnkey ව්‍යාපෘති 18 කට අදාල කාර්යසාධනය සියයට 4 සිට සියයට 46 දක්වා විය. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා කාර්ය සාධනයන් අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. | ව්‍යාපෘති අනුමත කිරීමට ප්‍රමාද වීම, ප්‍රතිපාදන ලබා නොදීම හා ප්‍රමාදවීම ව්‍යාපෘති අත්හිටුවීම වැනි විවිධ හේතු මත කාර්යසාධනයට ලඟා වීමට නොහැකි විය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතියද අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | එක් වාහනයක් භාවිතයට ගැනීමත් එකක් 2019.08.31 දිනට අපහරණ කටයුතු අවසන් කිරීමට කටයුතු සිදු කෙරේ. |

**3.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් 2017 වර්ෂය වන විට අයකර ගත යුතු ලෙස 2017 විසර්ජන ගිණුමේ දක්වා තිබූ රු.388,167 ක අලාභයේ 2018 වර්ෂයේ තත්ත්වය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කල යුතු වුවත් එසේ කර නොතිබූ අතර ඉන් රු.112,992 ක අලාභයක් අය නොවී පැවතුණි. | වර්ෂය තුල පාඩු හා හානි අයකර ගැනීම් හෝ කපා හැරීම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | රු.388,167 ක මුදල රක්ෂණ ආයතනවලින් සහ අදාළ නිලධාරින්ගෙන් අයකරගෙන ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 හා 2017 අගෝස්තු 14 දිනැති චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වාම කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අදාල අරමුණු, ඉලක්ක හා දර්ශකයන් හඳුනාගෙන කටයුතු කිරීම කළ යුතුය. | තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක මැන බැලීම සඳහා වන වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **i.** දෙපාර්තමේන්තුව පුරප්පාඩු 128 ක් පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුරප්පාඩු සඳහා කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කල යුතුය. | පදනම මත බඳවා ගෙන ඇත. 2018.12.31 දිනට පැවති පුරප්පාඩු 128 මෙම වර්ෂය අවසානයට අවම කර ගැනීමට අපේක්ෂා කෙරේ. |
| **ii.** දෙපාර්තමේන්තුවේ එක් සේවකයෙකු 2011 සැප්තැම්බර් 15 දින ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත නිදහස් කර 2019 සැප්තැම්බර් දක්වා එහි සේවය කරන | සේවකයන් විධිමත්ව මුදා හැරීමට හා කාලය නිමවූ පසුව | රාජ්‍ය කළමනාකරණ සහකාරවරයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන ඒ.එම්.එස්.පී. අත්තනායක මහතාගේ ඉල්ලීම ප්‍රකාරව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| අතර ඔහුට වැටුප් ලෙස රු.2,554,322 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ගෙවා තිබුණි. | ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. ගෙවන ලද වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ජනරාල්ගේ විධිමත් අනුමැතියකින්, 2011.09.15 දින සිට 2016.09.15 දින දක්වා තාවකාලිකව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවය සඳහා මුදා හැර ඇත. ඉන්පසු 2016.09.16 දින සිට 2019.09.14 දින දක්වා අදාල කාලසීමාව දීර්ඝ කර ගැනීම සඳහා නිලධාරියාගේ මෙන්ම, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේද ඉල්ලීම ප්‍රකාරව මේවන විට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |